# දේශීය ආර්ථිකය පණ ගැන්වීමට දේශීය හුවමාරු වෙළඳ ක්‍රම

මුදලට කල නොහැකි දෙයක් නොමැත යන්නද, සල්ලි දෙවියන්ගේ මල්ලි යන්නද සමාජය තුල මුල් බැස ගත් මතයකි. එහි සත්‍යාසත්‍ය බව කෙසේ වුවද මුදල් පසු පසම හඹා යන සමාජයක් තුල මෙම මතය තහවුරු වීම නොවැලැක් විය හැකිය.

ඈත අතීතයේ ජීවත් වූ මිනිසුන් තමන්ට අවශ්‍ය ආහාර, ඇඳුම් පැලඳුම් හා අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සරල හුවමාරුව මඟින් සපයා ගෙන ඇත. මෙම සරල හුවමාරුවේ මූලික සිද්ධාන්තය වන්නේ තමුන්ගේ නිෂ්පාදන අතිරික්තය තමන්ට අවශ්‍ය එහෙත් නිෂ්පාදනය කර ගත නොහැකි ද්‍රව්‍යයන් නිපදවන්නෙකුගේ නිෂ්පාදන අතිරික්තය සමඟ හුවමාරු කර ගැනීමයි. මෙම ක්‍රමයේදී භාණ්ඩ භාණ්ඩ අතරත්, සේවා සේවා අතරත්, භාණ්ඩ හා සේවා අතරත් හුවමාරුව සිදු විය. උදාහරණයක් ලෙස එකල විසූ කිරි ගොවීන් තමන්ගේ කිරි අතිරික්තය තමන්ගේ මුළුතැන්ගෙට අවශ්‍ය කරන හැලි වළං නිපදවන කුඹල් කරුවාගේ අතිරික්තය සමඟ හුවමාරු කර ගෙන ඇත.

අවශ්‍යතා සීමිත වූ සරල ප්‍රාථමික සමාජය තුල මෙම ක්‍රමය මනාව ක්‍රියාත්මක වුවද මිනිස් අවශ්‍යතා වඩා වඩා සංකීර්ණ වීමත් සමඟම හුවමාරු මාධ්‍යයක අවශ්‍යතාවය සපුරාලීම සඳහා මුදල් බිහිවිය.

මුදල් යනු යම් ආර්ථිකයක් තුල භාණ්ඩ හා සේවා හුවමාරුව සඳහා මාධ්‍යයක් ලෙස භාවිතා කිරීමට යොදා ගන්නා, සියළු දෙනා හොඳින් දන්නා, සම්මත ද්‍රව්‍යයක් වන අතර එය හුවමාරුව පහසු කරවීමෙන් නිෂ්පාදකයාට විශේෂිකරණය වීමට මග පාදයි. මුදල සතු මූලික කාර්යයන් වන්නේ හුවමාරු මාධ්‍යක් ලෙස භාවිතා කල හැකි වීම, වටිනාකම මැනීමේ ඒකකයක් ලෙස යොදා ගත හැකි වීම හා වටිනාකම රැස් කර තබා ගැනීම මාධ්‍යයක් ලෙස භාවිතා කල හැකි වීමයි. මේ නිසා නිශ්පාදනය විශේෂිකරණය වීමට මඟ පෑදීමෙන් මහා පරිමාන නිශ්පාදනට ඉඩ සැලසිනි,

නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා යොදවන යෙදවුම් පහත පරිදි වර්ග කරයි.


- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- කළමනාකරණය

මේවා නිෂ්පාදන සාධක ලෙසද හඳුන්වයි. නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය මෙම නිෂ්පාදන සාධක එක් අයෙකුට තනිවම යෙදවිය නොහැකි බැවින් පිටස්තර පාර්ශවයන්ගෙන් ලබා ගැනීම සිදු කරයි. මේවා අතුරින් භූමිය ශ්‍රමය හා කළමනාකරණය සපයන්නවුන්ට ඒ සඳහා වැටුප්, වේතන හා කුලී ආදිය ගෙවනු ලබන අතර ප්‍රාග්ධනය යොදවන්නන් නිෂ්පාදනයෙන් ලැබෙන ලාබයේ හිමිකරුවා වෙයි.

උදාහරණයක් ලෙස තම ගවයන්ගෙන් ලබා ගත් කිරි අතිරික්තය ගොවියන් සමඟ හුවමාරු කර ගත් එඬේරා හුවමාරු මාධ්‍යයක් ලෙස මුදල් භාවිතා වීම ඇරඹීමත් සමඟම තමන් නිපදවන කිරි අවශ්‍ය සියළු දෙනාට ලබා දී ඒ වෙනුවෙන් ලබා ගන්නා මුදල් තම සියළුම අවශ්‍යතා මිලදී ගැනීම සඳහා යොදවයි. කල් යාමේදී එඬේරා කිරි ගොවියකු බවට පත් වන අතර අවසානයේදී කිරි නිෂ්පාදකයකු බවට පත් වේ. මෙවිට කිරි නිෂ්පාදකයාට තම නිෂ්පාදනයට අවශ්‍ය කරන සාධක තමාට තනිවම යෙදවිය නොහැකි බැවින් ඒවා පිටතින් ලබා ගනියි. විශාල ගව පට්ටියක් නඩත්තුවට අවශ්‍ය ඉඩම් බද්දට ලබාගෙන ඒ සඳහා ගෙවීමක් සිදු කරයි. ගවයන් රැක බලා ගැනීමට කම්කරුවෙකු ලබා ගෙන ඒ සඳහා වැටුප්

ගෙවීමක් සිදු කරයි. තමන්හට ගොවිපල කළමනාකරණය අපහසු වන විට ඒ සඳහා කළමනාකරුවකුගේ සේවය ලබා ගෙන ඔහුට වැටුපක් ගෙවයි. තම මුදල් ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර පමණක් නිෂ්පාදනය සඳහා යෙදවීමෙන් උපයන ලාබය ඔහු එක් රැස් කර ගනී.


කල්ගත වීමේදී එම ආර්ථිකය තුල භාණ්ඩ හා සේවාවන් මෙන්ම මුදලුත් සංසරණය වීම ආරම්භ වීම නිසා නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් වශයෙන් දෙකොටසක් බිහි වෙයි. නිශ්පාදකයන් නිපදවන භාණ්ඩ පාරිභෝගිකයන් ලබා ගෙන නිෂ්පාදකයාට මුදල් ගෙවන අතර පාරිභෝගිකයන් නිෂ්පාදන සාධක නිෂ්පාදනය වෙනුවෙන් ආයෝජනය කර ඒ වෙනුවෙන් වැටුප්, වේතන හා කුලිය ලබා ගනියි.




රූපය 01 - සරල ආර්ථිකයක් තුල නිෂ්පාදකයින් හා පරිභෝගිකයන් අතර සිදු වන හුවමාරු ක්‍රියාවලිය

මෙම ක්‍රියාවලිය මෙසේ සිදු වීමේදී නිෂ්පාදකයාට ලැබෙන අමතර මුදල් තැන්පත් කිරීමටත් පාරිභෝජනය හා නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා හිග මුදල් ලබා ගැනීමේ අවශ්‍යතාවය මතු වේ. එසේම මුදල් එක් රැස්කර තබා ගැනීමේදී එහි ආරක්ෂාව පිළිබඳ ගැටළු ඇති වේ.


ආයතන ඇති වන්නේ ඉහත අවශ්‍යතාවය සපුරාලීම සඳහාය. මොවුන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජුවම දායක නොවන ඔවුන් සිදු කරන්නේ ඒ සඳහා පහසුකම් සැපයීම පමණකි. අමතරව මුදල් උපයා ගත් පුද්ගලයන් එම අමතර මුදල් මෙම ආයතනයන්හි තැන්පත් කරනු ලබන අතර එම තැන්පතු මුදල සඳහා පොලියක් ගෙවනු ලබයි. එසේම මුදල් අවශ්‍ය කරන පාර්ශවයන් මෙම ආයතන වලින් මුදල් ලබා ගන්නා විට ඒ සඳහා පොලියක් අය කරනු ලබයි. සෑම විටම අය කරනු ලබන පොලිය ගෙවනු ලබන පොලියට සාපේක්ෂව වැඩි වීම මුල්‍ය ආයතන වෙත මුදල් එක් රැස්වීමට මග පාදයි. ලබා ගත් ණය කාර්යක්ෂමව පරිහරණය කිරීම සඳහා පොලියක් ගෙවීම අත්‍යවශ්‍ය වුවද ව්‍යාපාරය දියුණු කිරීම සඳහා නැවත ආයෝජනය කල හැකි මුදල් පොලි වශයෙන් නිකරුනේ වැය කිරීමට සිදු වීම එහි දියුණුවට ඇති බාදාවකි. සැබවින්ම බොහෝ ව්‍යාපාර වල දියුණුවට ඇති විශාල බාධාව නම් ඔවුන් ලාභ ඉපයුවත් උපයන ලාභය ලබා ගත් ණය පියවීමටත් අදාල පොලිය ගෙවීමටත් වැය වීමයි. බොහෝ ආගම් වල මුදල් පොලියට දීම අනුමත නොකරත් මෙයට විරුද්ධ බල වේගයන් ඇති වීමක් දැකිය නොහැක. පොහොසත් විශාල ආයතන වලට මෙසේ ණය ලබා ගැනීමට අවශ්‍ය නොවන නිසා ණය පියවීමක්ද ඒ සමග පොලී ගෙවීමක්ද අවශ්‍ය නොවේ. නමුත් තනිව නැගී සිටිය නොහැකි කුඩා ආයතන මෙයට ගොදුරු බවට පත් වන අතර ඔවුන්ට මෙම විෂම චක්‍රයෙන් මිදීමට අපහසු වීම කණගාටුදායක තත්ත්වයකි.




රූපය 02- සරල ආර්ථිකයක් තුලට මූල්‍ය ආයතන වල ආගමනය

යම් යම් ප්‍රදේශ හා රටවල් වල පිහිටීම ස්වභාවය, කාලගුණය, භූ විෂමතාවය හා මානව සම්පත් අනුව ඒ ඒ ප්‍රදේශයන්හි යම් යම් දේ නිෂ්පාදනය කිරීම සඳහා විශේෂ වාසි ලැබී ඇත, එය ප්‍රාදේශිය විශේෂිකරණය නම් වන අතර එවැනි ප්‍රදේශවල හා රටවල් වල එම භාණ්ඩ අඩු මිලට නිශ්පාදන කලහැකි විමෙන් ඒවා අඩු මිලට වෙළඳපොලට නිකුත් කිරීමට හැකියාවක් ඇත. ජාත්‍යන්තර වෙලඳපොල සැලකූ කල මැද පෙර දිග ඛනිජ තෙල් නිශ්පාදනයටද, නවසිලන්තය කිරි නිශ්පාදනයටද ප්‍රමුඛ වී ඇත.

යම් රටක දේශිය නිෂ්පාදකයින්ට එතරම් අඩු වියදමකින් භාණ්ඩ නිෂ්පාදනය කල නොහැකි විට ඔවුන්ට ඒවා දේශිය වෙලදපොලට නිකුත් කල හැක්කේද වැඩි මිලක් යටතේය. මේවාට අඩු මිලක් ඇති විදේශිය නිෂ්පාදන සමඟ තරග කල නොහැකිය. මෙසේ වීම දේශිය මුදල් පිටරට වලට ඇදී යාමටත් දේශිය නිශ්පාදකයන් අධෛර්යමත් විමටත් බලපාන නිසා දේශිය නිශ්පාදනය පාඩු දායක වෙයි. ලාභ නොඋපදවන නිෂ්පාදන සඳහා ශ්‍රමය, භූමිය, කළමණාකරනය, ආයෝජනය කිරීම නිශ්ඵල දායක විමෙන් ඒවාද විදේශිය රට වෙත ගලා යාමද සිදු වේ. දේශිය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඵලදායි ලෙස යෙදවිය හැකි ශ්‍රමය, භූමිය, ව්‍යවසායකත්වයද එයට අහිමි වීම ආර්ථික තත්වය තව තවත් දුර්වල විමට හේතු වේ. එසේම නිෂ්පාදකයින් විදේශිය මූල්‍ය සමාගම්වලින් ණය ලබා ගැනිමේදි ඒවාට පොලියක් ගෙවිමට සිදු විම මෙම තත්ත්වය තව තවත් උග්‍ර විමට හේතුවකි.




රූපය 03- දේශීය ආර්ථිකයකින් සිදුවන කාන්දුවීම්

භූමිය ශ්‍රමය, කලමණාකරණය නිශ්පාදන ක්‍රියාවලියට ආයෝජනය කරන පාර්ශවයන් ඒ වෙනුවෙන් වැටුප්, වේතන, කුලිය ලබන අතර ප්‍රාග්ධන හිමියන් ලාභය ලබයි" සියල්ලන් අතර බෙදී යා යුතු ලාභය ප්‍රාග්ධන හිමියන්ට පමණක් ලැබීම ගැටළුවක. කාල් මාර්ක්ස්ට අනුව ලාභය යනු නොගෙවූ ශ්‍රමයය. ප්‍රාග්ධනය ආයෝජනය තුලින් ලබන සාමාන්‍ය ලාභය කෙසේ වෙතත් සමහර නිශ්පාදකයින් ලබන අධික ලාභය මගින් එක් රැස් කර ගත් අති විශාල ධනස්කන්දය තුල නොගෙවූ ශ්‍රමය නැතැයි කිසිවෙකුට පැවසිය නොහැක.

ඉහත කරුණු සලකා බැලීමේදී අපට පෙනී යන්නේ දේශීය සංසරණය විය යුතු මුදල් පිටතට ගලා යාමණී එම ආර්ථිකයේ නිෂ්පාදන ක්‍රියාවලියට යෙදවිය යුතු ශ්‍රමය ප්‍රාග්ධනය විදේශීයව ආයෝජනය කිරීම සුළු පිරිසක් වෙත අසීමිතව ධනය එක් රැස්වීමණී නිශ්පාදන ක්‍රියාවලියට දායක නොවන මූල්‍ය සමාගම් නඩත්තුව සඳහා මුදල් වැය වීම යන කරුණු දේශීය ආර්ථිකය දුර්වල කිරීමට හේතු වන බවයි. මෙය පාලනය කිරීම සඳහා යම් ආයතනවල මැදිහත් වීම අත්‍යාවශ්‍ය වේ. එය බොහෝ විට, රජයේ මහ බැංකුවෙන් සිදු කරන අතර ආර්ථිකය හැසිරීමෙහි ලා එය පහත කාර්යයන් ඉටු කරයි.

* බැංකු වල සංචිත පෙන්වා ගැනිම පාලනය.
* පොලි අනුපාතය තිරණය කිරිම.
* විදේශ විනිමය අනුපාතය පාලනය කිරිම.
* බදු රැස්කිරිම.
* මුදල් නිකුත් කිරිම ආදියයි

රජයත් මහ බැංකුවත් නිශ්පාදන ක්‍රියාවලියට දායක නොවේ. මෙහිදි රජය යනුවෙන් අදහස් වන්නේ රටක් පාලනය කිරිමෙහිලා අදාල වන ප්‍රතිපත්තිමය තිරණ ගැනිමේත් ඒවා ක්‍රියාත්මක කිරිමෙහි ලා නියැලි සිටින, නමුත් නිෂ්පාදන ක්‍රියාවලියට දායක නොවන අති විශාල ගණනක් වු දේශපාලකයන් ඔවුන්ගේ කාර්යය මණ්ඩල නොයෙකුත් රජයේ ආයතන හා එහි නිලධාරීන්ය. රටක පැවැත්මට ඔවුන්ද අත්‍යාවශ්‍ය පිරිසක් වුවද මෙහි ඇති සෝචනිය තත්වය වන්නේ රටක නිෂ්පාදනයෙන් අති විශාල ප්‍රමාණයක් වැය වන්නේ මෙවැනි පිරිස් නඩත්තුවට විමයි. අප රට සැලකු විට එහි නිශ්පාදන ක්‍රියාවලිය මඟින් මුදල් උපයාදිමට ප්‍රධාන වශයෙන් දායක වන්නේ කාන්තා තුන්කට්ටුවක් බව ප්‍රකට කරුණකි. එනම් මැද පෙරදිග සේවයෙන් නියුතු කාන්තාවන්, ලංකාවේ ඇගළුම් ක්ෂේත්‍රයේ සේවය කරන කාන්තාවන් හා වතු කරයේ තේ දළු නෙලන කාන්තාවන් යන තෙපාර්ශවයත් තව බොහෝ පිරිසකුත් දහ දුක් විඳිමින් උපයන මුදල් වලින් අති විශාල ප්‍රමාණයක් වැය වන්නේ ඉහත කි පාර්ශවයන් නඩත්තුවට බව අප පිලිගත යුතු කටුක සත්‍යයයි.

මෙම ලිපිය ලිවිමෙහි අරමුණ වන්නේ අප රටේ නිෂ්පාදනයට දායක වන අතර තුර උපයන මුදල් වලින් තවත් පරිසක් නඩත්තුවට නිකරුණේ වැය කරන මෙම ක්‍රමයට සුදුසු සරල විකල්ප කිහිපයක් හඳුන්වා දිමයි.

මුදල් යනු භාණ්ඩ හා සේවා හුවමාරුව සඳහා භාවිතා කරන මාධ්‍යයයි. යමකු නිපදවන සහල් අතිරික්තය විකිණිමෙන් හෙතෙම එය මුදල් බවට බවට පත් කර තමුන්ට අවශ්‍ය කිරි ලබා ගැනිමට එම මුදල් වැය කිරිමෙන් නැවත එය කිරි බවට පත් කරයි. මෙම ක්‍රියාවලිය සැලකු විට එහි පරිවර්තනයන් 2ක් සිදු වන බව පෙනි යයි. එනම් සහල් මුදල් බවටත් මුදල් නැවත කිරි බවටත් පත් විමයි. ඕනෑම පරිවර්ථනයකදි යම් හානියක් සිදු විම ණොවැලැක්විය හැකිය. ඔබ නිවසේ ඇති විදුලි බල්බය නිවසට ලැබෙන විද්‍යුත් ශක්තිය ආලෝකය බවට පරිවර්ථනය කරන නමුත් විදුලි බල්බයට ලැබෙන සම්පුර්ණ විද්‍යුත් ශක්තිය ආලෝක ශක්තිය බවට පත් නොවන අතර විශාල ප්‍රමානයක් තාප ශක්තිය බවට පත් වි අවට උණුසුම් විම සිදු වේ. විදුලි බල්බ දැල්විමෙන් අප බලාපොරොත්තු වන්නේ අලෝකය මිස උණුසුම නොවන නිසා තාප ශක්තිය යනු ඉහත පරිවර්තයේදි සිදු වූ ශක්ති හානියයි.

එසේම භාණ්ඩ හා සේවා මුදල් බවටත් නැවත එය භාණ්ඩ හා සේවා බවටත් පත් වන පරිවර්තන ක්‍රියාවලියේදි සැබෑ වටිනාකමට වැඩි ප්‍රමාණයක් මුදල් ගෙවිමට සිදු වන්නේ නිෂ්ඵලදායි ලෙස බදු මුදල් ලෙස වෙනත් පාර්ශවයන් කරා මුදල් ඇදි යන නිසාය. මා හඳුන්වා දෙන ක්‍රම වලින් බලාපොරොත්තු වන්නේ ඔබ මහන්සියෙන් කරන නිෂ්පාදනයේ වටිනාකමින් නිකරුනේ වැය කරන පොලිය බදු අතරමැදියන් අතට පත්වන මුදල්, භාණ්ඩයේ බාහිර ආටෝපයට වැය කරන මුදල් යනාදි හානින් අවම කිරිමේ ක්‍රම වේදයකට ඔබව යොමු කිරිමයි.

## සිට්ටු

මේ සඳහා උදාහරණ සෙවිමට අප වැඩි ඈතක යා යුතු නැත සිට්ටු යනු මේ සඳහා දිය හැකි කවුරුත් දන්නා නිදසුනකි. අසල් වාසින්, කිට්ටු මිතුරන් අතර මෙම සිටට්ටුවක් ඇති කර ගන්නා අතර කලින් එකඟත්වයට පැමිණි එක්තරා මුදලක් සියළු දෙනාටත් එක් වාරිකයක් සඳහා එකතු කර ගැනිමෙන් පසු සාමාජිකයින් තමන්ට හිමි අංකය තුන්ඩු ඇදිමෙන් තිරණය කරයි. පලමු වාරිකයට එකතු වු මුළු වාරික මුදල අංක 01 ලැබූ සමාජිකයාට පොලි රහිත ණයක් ලෙස පළමුව ලබා දෙයි. අනිකුත් සියලුම සාමාජිකයන්ට තමන්ට හිමි අංකය අනුව අනුපිළිවෙලට මුදල් ලැබෙන අතර තම තමුන්ගේ වාරික ගෙවිමෙන් එම ණය පියවිම සිදු කරයි. මෙම ණය කුඩා ව්‍යාපාරයන්ට හා හදිසි අවස්ථාවන් සඳහා යොදා ගැනිමට ඔවුන්ට පුලුවන.

**ධාන්‍ය පත්‍රිකා** (Grain-giro)

ඊජිප්තුවේ මීට වසර 4000කට පමණ පෙර අවරුදු 7 ක සශ්‍රික කාල පරිච්ඡේදයක්ද ඊට පසු තවත් අවුරුදු 7 ක සාගත කාලයක්ද උදා වී ඇති බවට සාක්ෂි ඇත. පළමුව පැමිණි සශ්‍රික කාල පරිච්ඡේදයේ එරට පාලකයා එම කාලයේදී ලැබුණු අටු කොටු පිරී ඉතිරී යන අස්වැන්නෙන් 1/5 ක් බද්දක් ලෙස අය කර ධාන්‍යාගාර වල ගබඩා කිරීමටත් එසේ ගබඩා කර ගත් ධාන්‍ය වල වටිනාකමට සමාන වටිනාකමක් ඇති වවුචරයක් වැනි ලියවිල්ලක් එම ධාන්‍ය ලබා දුන් පුද්ගලයන්ට නිකුත් කිරීමට කටයුතු සලසා ඇත. ඉන් පසුව පැමිණි සාගත කාලයේදී මෙම ලියවිල්ල මඟින් ගබඩා කළ ධාන්‍ය නැවත ලබා ගැනීමටත් එමෙන්ම මෙම ලියවිල්ල තමන්ගේ ණය ගෙවීමට, කුලිය ගෙවීමට මෙන්ම බදු ගෙවීමට යොදා ගැනීමෙන් ගබඩා කරන ලද ධාන්‍ය පංගුව මුදල් ලෙස භාවිතා කිරීමට හැකි වී ඇත.

**තලෙන්තු**

ශුද්ධ වූ බයිබලයේ ඇති තලෙන්තු පිළිබඳ උපමාවෙන් කියවෙන්නේ තමන් සතු මුදලට කල යුත්තේ එය වල දමා ආරක්ෂා කිරීම නොව එය ආයෝජනය කර එම මුදල වැඩි වර්ධනය කිරීම බවයි. මෙහි නූතන අර්ථ කථනය නම් තමන් සතු මුදල් බැංකුවේ තැන්පත් කර උද්ධමන වේගයට වඩා අඩු පොලියක් එයට එකතු වෙද්දී එම මුදලේ සැබෑ වටිනාකම අඩු වුවත් එය ගණනකින් වැඩි වුවා යැයි සතුටු වීමට වඩා තලෙන්තු යයි අප ව්‍යවහාර කරන අප සතු දක්ෂතාවය හා හැකියාවන්ද එයට එක් කර ආයෝජනය කිරීම මඟින් එය සැබෑ ලෙස වර්ධනය කිරීම කල යුතු බවයි.

මධ්‍යතන යුරෝපයේ බ්‍රැක්ට්‍රියට්ස් නම් රිදී කාසි විශේෂයක් භාවිතා වී ඇත නිදහස් මුදල් ලෙස භාවිතා වී ඇති ඒවාට තිබී ඇත්තේ තාවකාලික වටිනාකමක් පමණක් නිසා කලින් කලට එය යාවත්කාලීන කිරීම සඳහා මෙහි වටිනාකමින් 20-25% ප්‍රමාණයක් අය කර ඇත. එම නිසා මෙම මුදල් විශේෂය හිමි අය ඒවා අවලංගු වීම වැලැක්වීමට එය ආයෝජන කිරීම අනිවාර්ය වූ අතර නිබඳව වැඩ කරන ජනතාවක් බිහි කිරීමට මෙය ඉවහල් විය.

**දේශීය හුවමාරු වෙළඳ පද්ධති**

ලංකාවේ කිරි ගොවියා කිරි බෝතලය අලවිකරන්නේ රු 20 ක ට වුවත් ඔබ වෙළඳ පොළෙන් කිරි බෝතලයක් හෝ කිරි පිටි පැකටට්ටුවක් මිලදී ගැනෙන්නේ ඊට බොහෝ සෙයින් වැඩි මිලකටය නමුත් ඔබට සෘජුවම නිෂ්පාදකයා සමඟ ගනුදෙනු කල හැකි නම් මෙතරම් මුදලක් ඔබට ගෙවීමට සිදු නොවනවා මෙන්ම නිෂ්පාදකයාට තම නිෂ්පාදනයන් වැඩි මිලකට අලවිකිරීමට හැකි වනු ඇත.

දැන් බොහෝ රටවල ක්‍රියාත්මක වන ප්‍රාදේශිය වෙළඳ හුවමාරු පද්ධතින් අප අතර ද ඇති කර ගැනීමට දැන් කාලය පැමිණ ඇත. මේවාට හවුල් වන සියළුම සාමාජිකයන්ට ඔවුන් සතු පොදු අරමුදලකින් යම් මුදල් ප්‍රමාණයක් ලබා ගත හැකි අතර එය ඔවුනොවුන් අතර වෙළඳ කටයුතු සඳහා යොදා ගනී. මේ සඳහා දේශීය මුදල් භාවිතා කරන්නේ වංචා සිදු වීම වැලැක්වීමටය.

**සහයෝගිතාවය වර්ධනය**

ඉන්දුනීසියාවේ බාලි ප්‍රදේශයේ පිසැන්ග් නම් ග්‍රාමයේ ක්‍රියාත්මක වන අවුරුදු දහස් ගණනක් පැරණි ක්‍රමයක් වෙත අප දැන් යොමු වෙමු. ධීවරයින්, ගොවීන් හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගෙන් සමන්විත වන මෙම ග්‍රාමයේ සියලුම ගම් වැසියන් සාම්ප්‍රදායික බන්ජාර් නම් පද්ධතියේ සාමාජිකයන්ය. සෑම සතියකට වරක් රැස්වන මොවුන් ඔවුන්ගේ තැන්පතු මුදල පොදු අරමුදලකට දමයි. එම තැන්පතුවේ ප්‍රමාණයට සරිලන පරිදි "බොන්" නමින් හඳුන්වන සහතිකයක් ඔවුනට හිමිවේ. මෙම අරමුදලේ එකතු වන මුදල සාමාජිකයනගේ කුඩා මුදල් අවශ්‍යතාවයන් සඳහා අඩු පොලී ණයක් ලෙස ලබා දෙයි. එසේ නැතහොත් එය ප්‍රජා සංවර්ධන කාර්යයන් සඳහා යොදවනු ලබයි. තැම්පත්කරුවන් ලබන බොන් නම් සහතිකය හිලවී කොට ඔවුනට අනෙක් සාමාජිකයින්ගේ භාණ්ඩ, සේවාණී ශ්‍රමයණී දැනුම යනාදිය ලබා ගත හැකිය. මෙහිදී මුදල් ප්‍රාදේශියව සංසරණය වන අතර ඔවුන්ගේ නිෂ්පාදිත භාණ්ඩ හා සේවා සඳහා ඔවුනොවුන් අතරම වෙළඳපොලක් ඇති වේ.

**කුඩා පරිමාන ණය ක්‍රමයක්**

ගම්මාන වල දිළිදු පුද්ගලයන් බොහෝ විට සාක්ෂරතාවය අඩු හා කුලැටි පුද්ගලයන් නිසා ඔවුන් විශාල ආයතන වලින් ණය ලබා ගැනිමට මැලි වෙති. එමෙන්ම විශාල ආයතනද මෙවැනි පුද්ගලයන්ට ණය ලබා දිමට මැලි වන්නේ මෙවැනි අය බොහෝ විට ඉල්ලුම් කරන ණය ඉතා කුඩා ප්‍රමාණයේ ඒවා විමද, ඒවා නැවත පියවයිද, නැතිද, යන අවිශ්වාසයද, නිසාය. මෙයට හොඳ විසඳුමක් වන කුඩා පරිමාන ණය ලබා දිමෙහි ඇති විශේෂත්වය නම් මෙම ණයත් සමග ණය අයදුම්කරුවන්ට නිපුණතා සංවර්ධනට අවස්ථාද, සපයනු ලබන නිසා ලබා ගන්නා ණය ඉතා ඵලදායිව ආයෝජනයට මග සැලසිමයි. මෙ මගින් ඔවුන්ගේ හැකියාවන් ආත්ම විශ්වාසය හා තිරණ ගැනිමේ හැකියාවන් වැඩි දියුනු කිරීම ඔවුන්ගේ සමාජ තත්ත්වය උසස් විමටද, ඉවහල් වේ.

මෙම ක්‍රියාවලියේදි ණය සඳහා බාහිරින් ලැබෙන මුදල් මත යැපීමට සිදු වේ. එසේම මෙම කුඩා පරිමාන ණය යටතේ ආයතන මඟින් මුදල් පිටතට ගලා යාමද සිදු වේ. සපයන ණය තැන්පත් කරුවන්ගේ තැන්පතු වලින්ම ලබා ගැනිම මෙයට හොඳ විකල්පයකි.

ඉහත දැක්වූ ක්‍රම වලින් පහත ප්‍රතිලාභ අපට බලාපොරොත්තු විය හැක.

- ස්වකිය පැවැත්ම උදෙසා සියළුම දෙනාට නිශ්පාදන ක්‍රියාවලියට දායක විමට සිදු විම නිසා නිශ්පාදනය වර්ධනය විම.
- අතරමැරදියාගේ භූමිකාව හින වි යාම.
- තම පැවැත්ම කෙරෙහි ස්ව ශක්තිය මත විශ්වාස තැබිමට සිදුවිම.
- දේශපාලඥයින්ගේ භූමිකාව ක්ෂය වි යාමත් විශාල අකාර්යක්ෂම රාජ්‍ය තන්ත්‍රයන් නඩත්තු කිරීමට අවශ්‍යතාවය අඩුවිම.
- පරිසරය සමග සහජිවනය වැඩි දියුණු විම.

ඉහත දැක්වූ විවිධ ක්‍රමයන් අප රටට ගැලපෙන ලෙස හැඩගස්සවා ගැනිම හා අප රටට වඩාත් ප්‍රායෝගික ආර්ථික රටාවක් වැඩි වර්ධනය කිරිම ඔබට භාර කරමි.

ප්‍රසාද් වර්ණකුල
වැඩසටහන් සහකාර (පරිසර)